# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1760/40 - 2012 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2012.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2001.

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහාචාර්ය ජී. එල්. පීරිස්,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා පුළුල් ක්‍රමෝපාය සමූහයක් නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, විශේෂයෙන්ම (ඇෆ්ගනිස්ථාන ඉස්ලාම් එමිර් පාලන ප්‍රදේශය යනුවෙන් තමන් විසින් හඳුන්වාගනු ලබන) තලිබාන් යනුවෙන් සඳහන් කරනු ලබන ඇෆ්ගන් කණ්ඩායමට එරෙහිව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, 1267 (1999) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය මගින් සහ ඒ යෝජනා සම්මුතියේ සම්බාධක තන්ත්‍රයට 1526 (2004), 1617 (2005), 1735 (2006), 1822 (2008) 1904 (2009), 1988 (2011) සහ 1989 (2011) දරන යෝජනා සම්මුති ඇතුළුව පසුව කරන ලද යෝජනා සම්මුති මගින් කරන ලද වෙනස් කිරීම් සහ සවිමත් කිරීම් මගින්, සම්බාධක පැනවීමේ කමිටුව විසින් නම් කරනු ලබන (මෙහි මින්මතු "නම් කළ තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) අල්-කයිඩා සංවිධානය හෝ තලිබාන් සංවිධානය සමඟ සහයෝගීව ක්‍රියාකරන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් වන්නා වූ ද සම්බාධක පැනවීමේ කමිටුව විසින් සම්මත කර ගන්නා ලද "ඒකාබද්ධ ලැයිස්තුවේ" නම් සඳහන් වන්නා වූ ද තැනැත්තන් කෙරෙහි සම්බාධන පැනවීම සඳහා පියවර ගන්නා ලෙස එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් මත බැඳීම් සමූහයක් පනවනු ලැබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වැනි පරිච්ඡේදය යටතේ ක්‍රියා කරමින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් 1999 ඔක්තෝබර් මස 15 වැනි දින 1267 (1999) දරන යෝජනා සම්මුතිය ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

3. 1267 (1999) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය 4(ආ) ඡෙදය සහ ආශ්‍රිත ඡේද යටතේ අරමුදල් ක්‍රියාවිරහිත කිරීමට අදාල බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම ද, ඉහත කී පසුව සිදුකරන ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිවල නිශ්චිතව දක්වා ඇති වෙනස් කිරීම් සහ සවිමත් කිරීම් විශේෂයෙන්ම 1988 (2011) සහ 1989 (2011)

දරන යෝජනා සම්මුතිවල 1 වැනි ඡේදය ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම ද එමගින් ඉහත කී බැඳීම්වලට අනුකූලව ක්‍රියා කිරීමේ ක්‍රමවේදයක් නිශ්චිතව දැක්වීම ද මෙම නියෝගවල පරමාර්ථය වන්නේ ය.

4. (1) මේ නියෝගවල කාර්යය සඳහා, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන නිසි බලධරයකු සිටිය යුත්තේ ය.

(2) මහජනතාව වෙත තොරතුරු සැපයීමේ කාර්යය සඳහා නිසි බලධරයා විසින් -

(අ) පළමු ඒකාබද්ධ ලැයිස්තුව මේ නියෝග ක්‍රියාත්මක වීමෙන් ඉක්බිතිවම ; සහ

(ආ) ඒ ලැයිස්තුවට පසුව සිදු කරනු ලබන යම් සංශෝධන, ඒ සංශෝධන සිදු කරන ලද වහාම,

ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

5. නම් කළ තැනැත්තකු සඳහා සහ නම් කළ තැනැත්තකු වෙනුවෙන් හෝ නම් කළ තැනැත්තකුගේ විධානය පරිදි, නම්කළ තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් සතු හෝ නම් කළ තැනැත්තකුට, වෙනත් යම් තැනැත්තකුට හෝ අස්ථිත්වයකට සම්පූර්ණයෙන් හෝ හවුලේ අයත්ව තිබෙන, නම් කළ තැනැත්තකු, වෙනත් යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් දරනු ලබන හෝ පාලනය කරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් සමග කිසිම තැනැත්තකු විසින් ගනුදෙනු කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, බැරකරන ලද අරමුදල් ද ක්‍රියා විරහිත කරනු ලබන තාක්දුරට, ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් මත ලැබිය යුතු පොළිය හෝ වෙනත් ඉපැයුම් හෝ ඒ ගිණුම ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් බවට පත්වීමට පෙර ඇති වූ හෝ අවසන් වූ කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ බැඳීම් යටතේ ලැබිය යුතු ගෙවීම් හෝ තුන්වන පාර්ශවයක් විසින් ඒ ගිණුමට මාර කරන ලද වෙනත් අරමුදල් ද යම් තැනැත්තකු විසින්, ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් වෙත බැර කරනු ලැබිය හැකි ය.

6. කිසිම තැනැත්තකු විසින්, යම් නම් කළ තැනැත්තකු වෙත හෝ යම් නම් කළ තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා හෝ ඒ නම්කළ තැනැත්තා සඳහා සහ ඒ නම් කළ තැනැත්තා වෙනුවෙන් හෝ ඒ නම් කළ තැනැත්තාගේ විධානය පරිදි වෙනත් තැනැත්තකු හෝ අස්ථිත්වයක් වෙත ඍජුව හෝ වක්‍රව යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ලබා දී නොකළ යුතු ය :

එසේ වුව ද, බැර කරන ලද අරමුදල් ද ක්‍රියාවිරහිත කරනු ලබන තාක්දුරට, ක්‍රියා විරහිත කරන ලද ගිණුමක් මත ලැබිය යුතු පොළිය හෝ වෙනත් ඉපැයුම් හෝ ඒ ගිණුම ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් බවට පත්වීමට පෙර ඇති වූ හෝ අවසන් වූ කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ බැඳීම් යටතේ ලැබිය යුතු ගෙවීම් හෝ තුන්වන පාර්ශවයක් විසින් ඒ ගිණුමට මාරු කරන ලද වෙනත් අරමුදල් ද යම් තැනැත්තකු විසින්, ක්‍රියා විරහිත කරන ලද ගිණුමක් වෙත බැර කරනු ලැබිය හැකි ය.

7. ශ්‍රී ලංකාවේ සිටින යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් නැතහොත් ශ්‍රී ලාංකිකයකු හෝ ශ්‍රී ලංකාවේ වාසිකයකු වන තැනැත්තකු සම්බාධක පැනවීමේ කමිටුව විසින් නම් කරනු ලැබ ඇති බවට තොරතුරු ලැබුණු අවස්ථාවක දී, නිසි බලධරයා විසින් ඒ නම් කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, ඒ නම් කළ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය වෙත

(i) ඒ නම් කිරීම සහ ඒ නම් කිරීමෙහි බලපෑම පිළිබඳ තොරුතුරු ;

(ii) සමාලෝචනය කිරීමේ කාර්ය පටිපාටිය සහ ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ;

(iii) නම් කිරීම සඳහා බලපෑ හේතු සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ හෙළි කළ හැකි තොරතුරු ;

ලබාදීම සඳහා හැකි සෑම සාධාරණ උත්සාහයක්ම දරනු ලැබිය යුතු ය.

8. 7 වැනි නියෝගයේ සඳහන් යම් තැනැත්තකු විසින්, සම්බාධක කමිටුව මගින් ලැයිස්තුවෙන් නම් කිරීම ඉවත් කරවා ගැනීමක් අපේක්ෂාවෙන් ඒ සඳහා සහය වන ලෙසට නිසි බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. නිසි බලධරයා විසින් ඒ ඉල්ලීම සම්බාධක පැනවීමේ කමිටුව වෙත ඉදිරිපත් කොට, 1267 (1999) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය සහ ඉහත කී පසුව සම්මත කරන ලද යෝජනා සම්මුතීන් ප්‍රකාර, නම් කළ තැනැත්තන් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට අදාළ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන් සහ කාර්යය පටිපාටිවලට අනුකූල වන ආකාරයට ක්‍රියා කරනු ලැබිය යුතු ය.

9. (1) නිසි බලධරයා විසින් එසේ කිරීම සඳහා වූ තමාගේ අපේක්ෂාව පිළිබඳව සම්බාධක පැනවීමේ කමිටුව වෙත දැනුම් දීමෙන් පසුව සහ සම්බාධක පැනවීමේ කමිටුවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමෙන් පසුව, නිශ්චිත අරමුදල් නිදහස් කරගත හැකි වන පරිදි හෝ

වත්කම් ලබාගත හැකි වන පරිදි 5 වැනි හෝ 6 වැනි නියෝගවල සඳහන් තහනම් කිරීමක් ඉවත් කිරීම සඳහා විශේෂිත බලය ලබා දීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, ඒ බලය ලබා දීම සම්බන්ධයෙන් උචිත කොන්දේසි නිසි බලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) සම්බාධක පැනවීමේ කමිටුවේ නියමයන්ට අනුකූලව ඕනෑම අවස්ථාවක දී ඒ බලය ලබාදීම අවලංගු කිරීම හෝ වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති 1452, 1735 සහ 1904 හි දක්වා ඇති ප්‍රමිතීන් සහ කාර්ය පටිපාටිවලට අනුකූලව සහ 1267 දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතියට සහ ඉහත කී පසුව සම්මත කරන ලද යෝජනා සම්මුතිවලට අනුව ක්‍රියා විරහිත කරන ලද අරමුදල් වෙත ප්‍රවේශ වීමට අදාල වෙනත් යම් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනාවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන් සහ කාර්යය පටිපාටිවලට අනුකූලව නිසි බලධරයා විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

10. (1) තමා, නම් කළ තැනැත්තකු නොවන බවට කියා සිටිනු ලබන තැනැත්තකු විසින්, තමා සම්බාධක පැනවීමේ කමිටුවේ ඒකාබද්ධ ලැයිස්තුවේ නම සඳහන් තැනැත්තකු නොවන බවට සඳහන් කරමින් සහතිකයක් නිකුත් කරන ලෙස ඉල්ලමින් නිසි බලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ සම්බන්ධයෙන් උචිත පරිදි විමසීම් කිරීමෙන් පසුව සහ ඒ ඉල්ලුම්කරු නම් කළ තැනැත්තකු නොවන බවට තහවුරු කර ගැනීමෙන් පසුව, නිසි බලධරයා විසින් ඒ ඉල්ලුම්කරු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ සහතිකයක් නිකුත් කිරීම නිසිබලධරයා විසින් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඒ සඳහා වන හේතු ද සමඟ ස්වකීය තීරණය නිසි බලධරයා විසින් ඉල්ලුම්කරු වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

11. 10 වැනි නියෝගය යටතේ වූ නිසි බලධරයාගේ තීරණය මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණය සමාලෝචනය කිරීම සඳහා, ඒ තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක (30) කාලයක් ඇතුළත, මහාධිකරණය වෙත ඒ තීරණයට එරෙහිව ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

12. (1) යම් නම් කළ තැනැත්තකු සම්බන්ධයෙන් 5 වැනි සහ 6 වැනි නියෝග යටතේ වූ යම් බැඳීමකට අමතරව, යම් තැනැත්තකු විසින් -

(අ) යම් වර්තමාන ගනුදෙනුකරුවකු හෝ තමා විසින් ව්‍යාපාර කටයුතු කර ඇති ගනුදෙනුකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තමා දන්නා වෙනත් යම් තැනැත්තකු නම් කළ තැනැත්තකු බව හෝ නම් කළ තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තකු බව තමා දැන සිටින හෝ සැක කරනු ලබන අවස්ථාවක දී, ඒ පිළිබඳව අවස්ථාවෝචිත පරිදි, නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත් දැනුම් දිය යුතු ය.

(ආ) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, එනම් :-

(i) අරමුදල්වල තත්ත්වය, 5 වැනි නියෝගය සහ 6 වැනි නියෝගය යටතේ වූ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග සහ අරමුදල් සම්බන්ධයෙන් ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ග පිළිබඳව ;

(ii) නම් කළ තැනැත්තා වෙනුවෙන් අදාළ ආයතනය විසින් දරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත්වල ස්වභාවය සහ ගණන හෝ ප්‍රමාණය හෝ නම් කළ තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරන ලද හෝ දරන ලද ගනුදෙනු ; සහ

(iii) මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම පහසු කරවනු ලබන වෙනත් යම් තොරතුරුක් පිළිබඳව ;

අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු සැපයිය යුතු ය.

(ඇ) මෙම තොරතුරු සත්‍යාපනය කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා සමඟ හෝ මූල්‍ය බුද්ධි ඒකකය සමඟ සහයෝගීව ක්‍රියා කළ යුතු ය.

(2) මේ නියෝගයට අනුකූලව සපයා ඇති හෝ ලැබී ඇති යම් තොරතුරක්, ඒ තොරතුරු සපයා ඇත්තේ හෝ ලැබී ඇත්තේ යම් කාර්ය සඳහා ද ඒ කාර්ය සඳහාම පමණක් භාවිතා කරනු ලැබිය යුතු ය. මේ නියෝගයට අනුකූලව නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත සපයා ඇති යම් තොරතුරක් යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවා ඇති යම් සීමා කිරීමක් උල්ලංඝණය කිරීම ලෙස සලකනු නොලැබිය යුතු ය.

13. (1) මේ නියෝග යටතේ වූ බැඳීමකට අනුව, 5 වැනි හෝ 6 වැනි නියෝගය යටතේ වූ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගයකට යටත්වන්නා වූ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් දරනු ලබන යම් තැනැත්තකු විසින්, ඒ ක්‍රියාවිරහිත කිරීම ක්‍රියාත්මක වීමෙන් පසුව, ස්වකීය අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කරනු ලැබ ඇති තැනැත්තා වෙත ඒ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියා මාර්ගය පිළිබඳව සහ ක්‍රියා විරහිත කිරීම ඉවත්කර ගැනීම සඳහා පවතින කාර්යපටිපාටි පිළිබඳව දැනුම් දීමට සියලු සාධාරණ ප්‍රයත්න දරනු ලැබිය යුතු ය.

(2) ඒ අරමුදල් දරනු ලබන තැනැත්තා විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ද වහාම දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය. මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඒ කරුණ පිළිබඳව වහාම නිසි බලධරයා වෙත දැනුම් දිය යුතු ය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ දැනුම් දීම, ඒ ක්‍රියා විරහිත කිරීමේ දින සිට සති දෙකක කාලයක් ඇතුළත ඒ ක්‍රියාවිරහිත කිරීම බලපාන තැනැත්තාගේ නෛතික නිත්‍ය පදිංචි ස්ථානය වෙත කරනු ලැබිය යුතු ය.

(4) ක්‍රියා විරහිත කිරීම බලපාන තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත නිත්‍ය පදිංචිව සිටී නම්, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගය පිළිබඳ දැන්වීම නිසි බලධරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මගින් ඒ ක්‍රියා විරහිත කිරීමේ නියමය බලපාන තැනැත්තා නිත්‍ය පදිංචිව සිටින රටෙහි ආණ්ඩුව වෙත සපයනු ලැබිය යුතු ය. ඒ දැන්වීම භාරදෙන ලෙසට වන ඉල්ලීමක් ද ඒ දැන්වීම සමඟ සපයනු ලැබිය යුතු ය.

14. මේ නියෝග යටතේ වූ බැඳීමකට අනුව 5 වැනි හෝ 6 වැනි නියෝගය යටතේ වූ ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගයකට යටත්වන්නා වූ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් දරනු ලබන යම් තැනැත්තකු විසින්, යම් නම් කළ තැනැත්තකුගේ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියා විරහිත කිරීමට නියමිත බවට හෝ වත්කම් ලබා නොදෙන බවට, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගය ගැනීමට පෙරාතුව යම් කවර හෝ විටක, ඒ නම් කළ තැනැත්තා වෙත දැනුම් දීම තහනම් වන්නේ ය.

15. (1) මේ නියෝගවල 5, 6 සහ 14 වැනි නියෝගවල නිශ්චිතව දක්වා ඇති බැඳීම්වලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන හෝ ඒ නියෝගවල නිශ්චිතව දක්වා ඇති විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු මේ නියෝග යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීමේ සහ දඩය යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) මේ නියෝගවල 12 වැනි නියෝගයෙහි හෝ 13 වැනි නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ නියෝගය යටතේ වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

16. (1) මේ නියෝග යටතේ වූ යම් බැඳීමක් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය විය හැකි බවට අදාල වන යම් කාරණයක් හෝ තොරතුරක් නිසි බලධරයා, මූල්‍ය බුද්ධි ඒකකය සහ අමාත්‍යවරයා විසින්, උචිත නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ආයතන සම්බන්ධයෙන් වන විට දී, පරිපාලනමය දණ්ඩන පැනවිය යුතු ද නැද්ද යන්න සළකා බැලීම සඳහා ඒ ආයතනවලට අදාළ අධීක්ෂණ වෙත ද යොමු කළ යුතු ය.

(2) නිසි බලධරයා විසින් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, මූල්‍ය බුද්ධි ඒකකය, අධීක්ෂණ අධිකාරීන් සහ වෙනත් උචිත නියෝජ්‍යායතනවල අදහස් විමසා මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම අධීක්ෂණය කිරීම සහ මේ නියෝගවලට අදාල දණ්ඩන බලාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සැළැස්මක් නිර්මාණය කරනු ලැබිය යුතු ය.

(3) නිසි බලධරයා විසින්, මේ නියෝග යටතේ වූ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම සඳහා සහ බැඳීම් බලාත්මක කිරීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

17. මේ නියෝගවල කාර්යය සඳහා -

"ඒකාබද්ධ ලැයිස්තුව" යන්නෙන්, 1267 (1999) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය ප්‍රකාර සම්බාධක පැනවීමේ කමිටුව විසින් සම්මත කර ගන්නා ලද ලැයිස්තුව අදහස් වන අතර ඒ ලැයිස්තුවට 1999 සිට පසුව කරන ලද සංශෝධනය ද ඊට ඇතුළත් වේ.

"ගනුදෙනු කිරීම" යන්නෙන්, අරමුදල් හා වෙනත් මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් වන විට, ඒවා භාවිතා කිරීම, වෙනස් කිරීම, සංචලනය කිරීම. ඊට ප්‍රවේශ වීමට ඉඩදීම හෝ පැවරීම හෝ ආයෝජන කළමනාකරණය ද ඇතුළුව ඒවායේ ප්‍රමාණයේ, වටිනාකමේ, පිහිටීමේ, අයිතියේ, සන්තකයේ, ගුණාංගයේ හෝ ගමනාන්තයේ යම් වෙනසක් ඇතිවීමට හේතුවන පරිදි වෙනත් ආකාරයකින් ගනුදෙනු කිරීම හෝ ඒ අරමුදල් සහ වත්කම් භාවිත කිරීමට හැකිවන වෙනත් යම් වෙනසක් කිරීම අදහස් වන අතර, ආර්ථික සම්පත් සම්බන්ධයෙන් වන විට, විකිණීම, කුලියට දීම හෝ උකස් කිරීම ඇතුළු යම් ආකාරයකින් අරමුදල්, භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම සඳහා ආර්ථික සම්පත් හුවමාරු කිරීම හෝ භාවිත කිරීම අදහස් වේ.

"මූල්‍ය බුද්ධි ඒකකය" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය අදහස් වේ.

"ක්‍රියා විරහිත කිරීම" යන්නෙන්, අරමුදල්, වෙනත් මුල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ගනුදෙනු කිරීමෙන් වළක්වනු ලබන හෝ ගනුදෙණු කිරීම සඳහා ඒවා ලබා දීමෙන් වළක්වනු ලබන ක්‍රියාමාර්ග ගැනීම අදහස් වේ.

"අරමුදල්, වෙනත් මුල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් " යන්නෙන් යම් නම් කළ තැනැත්තකු හෝ ඒ නම් කළ තැනැත්තා සඳහා හෝ වෙනුවෙන් හෝ ඒ නම් කළ තැනැත්තාගේ විධානය පරිදි ක්‍රියා කරන වෙනත් තැනැත්තකු හෝ අස්ථිත්වයක් සතු හෝ, යම් නම් කළ තැනැත්තකු හෝ ඒ නම් කළ තැනැත්තා සඳහා හෝ වෙනුවෙන් හෝ ඒ නම් කළ තැනැත්තාගේ විධානය පරිදි ක්‍රියා කරන වෙනත් තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් දරනු ලබන හෝ, ඍජුව හෝ වක්‍රව සම්පූර්ණයෙන් හෝ හවුලේ අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන බැංකු ණය, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර සහ ණයවර ලිපි ඇතුළත්ව, එහෙත් ඒවාට සීමා නොවන්නා වූ, ඕනෑම ආකාරයක, ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි, චංචල හෝ නිශ්චල, කවර හෝ ආකාරයකින් අත්කර ගනු ලැබූ වත්කම් සහ විද්‍යුත් හෝ ඩිජිටල් ඇතුළු ඕනෑම ආකාරයකින් වූ, ඒ වත්කම් පිළිබඳ අයිතිය සඳහා සාක්ෂි දරනු ලබන හෝ ඒ වත්කම් කෙරෙහි වන සම්බන්ධතාවය සඳහා සාක්ෂි දරනු ලබන නෛතික ලේඛන හෝ සාධන පත්‍ර ඇතුළත් විය යුතු ය. තව ද, ඊට පහත සඳහන් දේ ද ඇතුළත් විය යුතු ය.

(i) ඒ අරමුදල් වලින්, වත්කම්වලින් හෝ ආර්ථික සම්පත්වලින් උපචිත වන හෝ ඇති වන සියලු පොළී මුදල්, ලාභාංශ හෝ වෙනත් ආදායම් හෝ වටිනාකම් ; සහ

(ii) වක්‍රව අයිතිය දරනු ලබන අරමුදල්, වත්කම් හෝ ආර්ථික සම්පත්.

ආර්ථික සම්පත් යන්නට, අරමුදල් නොවන්නා වූ එහෙත් අරමුදල්, භාණ්ඩ හෝ සේවා ලබාගැනීමට යොදාගනු ලැබිය හැකි සෑම ආකාරයකම වත්කම් ද ඇතුළත් විය යුතු ය.

"අස්ථිත්වය" යන්නේ, සංස්ථාගත මණ්ඩලයක්, භාරයක්, හවුල් ව්‍යාපාරයක්, අරමුදලක්, සංස්ථාගත නොකළ සංගමයක් හෝ සංවිධානයක් අදහස් වේ.

"මහාධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද, කොළඹ දී පවත්වනු ලබන, බස්නාහිර පළාත සඳහා වූ මහාධිකරණය අදහස් වේ.

"ආයතනය" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යාවස්ථාව යටතේ විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ.

"තැනැත්තා" යන්නෙන්, (2 වැනි අධිකාරිය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"සම්බාධක පැනවීමේ කමිටුව" යන්නෙන් -

(අ) 1267 (1999) සහ 1989 (2011) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති ප්‍රකාර පිහිටුවා ඇත්තා වූ, අල් - කයිඩා සංවිධානය සහ එහි ආශ්‍රිත තැනැත්තන් සහ අස්ථිත්ව සඳහා සම්බාධක පැනවීම සම්බන්ධයෙන් වගකිව යුතු අල්-කයිඩා සම්බාධක පැනවීමේ කමිටුව ;

(ආ) 1988 (2011) සහ 1989 (2011) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති ප්‍රකාර පිහිටුවා ඇත්තා වූ, තලිබාන් සංවිධානය සඳහා සම්බාධක පැනවීම සම්බන්ධයෙන් වගකිව යුතු තලිබාන් සම්බාධක පැනවීමේ කමිටුව ; හෝ

(ඇ) ඒ කමිටු දෙකම,

අදහස් වේ.

06-594

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.